රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 02/2020

මගේ අංකය : EST-1/MISCL/06/0047
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2020.02.03

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## <u>ප්‍රමිතිකරණය කරන ලද භූගෝලීය නාම භාවිතා කිරීම</u>

2014.12.17 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණය පරිදි ශ්‍රී ලංකාවේ භූගෝලීය නාම ප්‍රමිතිකරණය සඳහා පිහිටුවන ලද භූගෝලීය නාම ප්‍රමිතිකරණ කමිටුව විසින් ස්ථානීය නාම, ස්වභාවික භූගෝලීය අයිතමයන්, මාර්ග හා ජල මාර්ග යනාදී ලක්ෂ පහක පමණ භූගෝලීය නාම සංඛ්‍යාවක් ප්‍රමිතිකරණයෙන් අනතුරුව www.geonames.gov.lk වෙබ් අඩවියට ඇතුළත් කර ඇත.

02. එම වෙබ් අඩවියෙහි ඇතුළත් කර ඇති ප්‍රමිතිකරණය කරන ලද අනන්‍ය වූ භූගෝලීය නාම මින් ඉදිරියට සියලුම රාජ්‍ය ආයතන විසින් සිය රාජකාරී කටයුතුවලදී භාවිතා කිරීම මඟින් පරිපාලන සහ සන්නිවේදන කටයුතු වඩා ඵලදායීව හා කාර්යක්ෂමව සිදු කළ හැකි වේ. තවද ස්ථාන පදනම් කරගත් සේවාවන් කාර්යක්ෂම කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පදනම මෙමඟින් සැකසෙන බැවින් අවශ්‍ය අවස්ථාවලදී භූගෝලීය නාම භාවිතා කිරීම සඳහා ඉහත සඳහන් වෙබ් අඩවිය මඟින් නාම ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ.

03. භූගෝලීය නාම ප්‍රමිතිකරණ දත්ත පද්ධතිය භාවිතා කිරීමේදී නාමයන් පිළිබඳව යම් ගැටලුවක් වේනොත් එම ගැටලු www.geonames.gov.lk වෙබ් අඩවිය හරහා ඉදිරිපත් කළ හැකි අතර, වැඩිදුර තොරතුරු සඳහා පහත දුරකථන අංක අමතා සහය ලබා ගත හැක.

| | | |
|---|---|---|
| මිනින්දෝරු අධිකාරී (භූගෝලීය නාම) | - | 011-2368599 |
| ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (සිතියම්කරණ හා භූගෝලීය නාම) | - | 011-2581960 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සර්වේයර් ජනරාල් (සිතියම්කරණ හා භූගෝලීය නාම) | - | 011-2369586 |

04. මෙම චක්‍රලේඛය 2018.09.04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණය පරිදි ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ එකඟතාව මත නිකුත් කෙරේ.

එස්. හෙට්ටිආරච්චි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය